මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: TIP/TP/01/10(220)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.01.01

# මාධ්‍ය නිවේදනය

**මෙතෙක් පැවති බදු අනුප්‍රමාණයන්ගේ වලංගු කාලය දීර්ඝ කරමින් 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ 2024 දෙසැම්බර් මස 31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධයෙනි.**

වඩාත් සරල සහ විනිවිදභාවයකින් යුත් බදු ක්‍රමයක් පවත්වා ගැනීමේ අරමුණින්, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු තෝරාගත් භාණ්ඩ වර්ග 63 ක් ආනයනය කිරීමේ දී මෙතෙක් පවත්වාගෙන යමින් සිටින විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, **පැවති බදු අනුප්‍රමාණයන් යටතේම,** එකී භාණ්ඩ මත සංශෝධනය කිරීමකින් තොරව, 2025 ජනවාරි මස 01 දින සිට ඉදිරියටත් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා 2024 දෙසැම්බර් මස 31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව, පරිප්පු, සුදුසීනි, අර්තාපල්, ලොකුළූණු, රතුළූණු, සුදුළූණු, පොල්තෙල් ඇතුළු එළවළු තෙල්, ටින් මාළු, වියළි මිරිස් ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ 63 ක් (රේගු සංකේතාංන 210 ක්) සඳහා මෙතෙක් පැවති බදු අනුප්‍රමාණයන් සංශෝධනයකින් තොරව එලෙසම පවත්වා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් පාරිභෝගික ජනතාවට භාණ්ඩ මිල ඉහළයාමක් සිදුනොවන අතර, සහල්, උඳු, මුං ඇට, බඩ ඉරිඟු, කුරක්කන්, කහ, පළතුරු වර්ග, මාළු සහ කරවල ආදී දේශීය කෘෂි සහ ධීවර කර්මාන්තය ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම පනත යටතේ ක්‍රියාත්මක කරන ලද බදු අනුප්‍රමාණ එලෙසම පවත්වා ගැනීමට මෙම 2024 දෙසැම්බර් මස 31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය මගින් කටයුතු කර ඇත.